# අලුත් මුහුණකින් එන්නේ පැරණි යටත්විජිතවාදයමයි

මොහාන් සමරනායක



වර්තමානයේ ලෝක දේශපාලන රටාව හඳුනා ගැනීමේ දී පැහැදිළිව පෙනෙන දේ තමයි, සියවස් ගණනාවක් පුරා ලෝකය පුරා සිදුවූ යටත් විජිතවාදී ක්‍රියාවලිය තවදුරටත් එළෙසම සිදුවන බව. එහෙත් මෙම ක්‍රියාවලිය සිදුවන ආකාරයේ වෙනසක් තිබෙනවා. අතීතයේ දී මෙය සිදුවූයේ ඍජු යටත්විජිතවාදී ස්වරූපයකින්. බලවත් රටවල් සෙසු රටවල් යටත් කරගෙන ඔවුන්ට අවශ්‍ය විදිහට පාලනය කළා. එසේත් නොමැතිනම් තමන්ගේ අණට යටත් පාලකයන් හරහා පාලනය කළා. අද මේ විදිහටම නොවුණත් වෙනස් ස්වරූපයයෙන් ක්‍රියාත්මක වන්නේත් එම ක්‍රියාවලියමයි.

ධනවත්, බලවත් රටවල් විවිධ ක්‍රියාදාමයන් හරහා සෙසු රටවල් පාලනය කරනවා. ඇත්තෙන්ම මෙය ශෝකජනක ප්‍රවණතාවයක්. වෙළඳපොළ, නිෂ්පාදන අමුද්‍රව්‍ය ආදී ආර්ථිකමය කරුණු හරහා ඔවුන් මෙම පාලනය සිදුකරන ආකාරය පැහැදිළිව තේරුම් ගැනීමට හැකියාව තිබෙනවා. ඇත්තෙන්ම කියනවා නම් සෝවියට් දේශයේ බිඳවැටීමෙන් පසු සියලු යථාර්ථයන් අමතක කොට ලෝකය පැහැදිළි ලෙසම යළි යටත් විජිතකරණයට ගොදුරු වෙමින් තිබෙනවා. සෝවියට් දේශය පවතිද්දි එහි යම් පාලනයක් තිබුණා. නමුත් එද එම තත්වය නැහැ. විශේෂයෙන් ඇමෙරිකාව තමන්ගේ තනි මතයට අනුව කටයුතු කරමින් සිටිනවා. ඇල්බට් අයින්ස්ටයින් වරෙක සඳහන් කළා ලෝකයේ ප්‍රධාන රටවල් දියුණු වෙන්නේ නොදියුණු රටවල්වල සම්පත් අරගෙන කියලා. අද යථාර්ථය දකින බොහෝ විද්‍යඥයින්, දාර්ශනිකයින් මේ කොල්ලකාරී තත්වය ඒ අයුරින්ම දකිනවා.

මෙම ක්‍රියාදාමයේ දී ඔවුන් අලුත් ක්‍රම උපයෝගී කරගන්නවා. අලුත් මෙවලම් භාවිතා කරනවා. එය දිනෙන් දින විවිධාකාරයෙන් ක්‍රියාත්මක වෙනවා.

අපි යළිත් අතීතයට යමු. මම පෙරදීම සඳහන් කළා බලවත් ජාතීන් ලෝකය පාලනය කිරීම සඳහා අලුත් මෙවලම් භාවිතා කරමින් සිටින බව. ඒ අනුව තමයි 1945 න් පස්සෙ එතෙක් බ්‍රිතාන්‍ය සතුව පැවති ලෝක ආධිපත්‍යය ඇමරිකා එක්සත් ජනපදය අතට මාරුවෙන්නෙ. බ්‍රිතාන්‍යයන් මෙම බලය රැකගැනීමට උත්සහා දරනවා. එහෙත් ඇමෙරිකාවෙ නව සැලසුම් හමුවේ ඔවුන් පසුබසිනවා. ඇමෙරිකාව ලෝකයේ බලවතා බවට පත්වෙනවා. එහෙත් ඔවුන්ට එකම බලවතා හැටියට කටයුතු කරන්න ලැබෙන්නේ නැහැ. සෝවියට් දේශය ඇතුළු සමාජවාදී කඳවුර ඔවුන්ගෙ ගමනට අභියෝග යක් වනවා. අලුතින් නිදහස ලැබූ රටවල් මේ කඳවුර සමඟ එක්වනවා. නොබැදි ව්‍යාපාරය නිසාත්, බලතුලනය ආරක්ෂා වෙනවා.

මේ තත්වය තමන්ගෙ ගමනට ඇති බාධාවක් බව ඇමරිකාවට වැටෙහෙනවා. ඔවුන් දන්නවා සෝවියට් දේශය ප්‍රමුඛ සමාජවාදී කඳවුර විනාශ කළ යුතු බව. ඒ නිසා ඔවුන් ඒ සඳහා විවිධ මෙවලම් පාවිච්චි කරන්න පටන් ගන්නවා. සමාජවාදය කියන්නෙ මූලික මිනිස් අයිතිවාසිකම් ගරු නොකරන රාක්ෂයෙක්, සමාජවාදය තුළ මානව හිමිකම් උල්ලංඝනය කෙරෙනවා, මේ ආදී වශයෙන් ඔවුන් ලෝකය පුරා ප්‍රචාරයන් ගෙනයනවා. ඒ සඳහා ජනමාධ්‍ය, කලාව ආදී හැම ක්ෂේත්‍රයක්ම භාවිතා කරනවා. ඒ විතරක් නොවෙයි, තෝරාගත් රටවල් පුද්ගලයන් ශිෂ්‍යත්ව ආදී වරප්‍රසාද හරහා තමන්වෙත නතු කරගෙන, ඔවුන් තමන්ගෙ මතය පිළිගන්න ආකාරයේ මිනිසුන් බවට පත්කරනවා. උදාහරණයක් විදියට කියනවා නම් විශ්ව විද්‍යාල තුළ ධනවාදයේ කොල්ලකාරී තත්වයට එරෙහිව යමින් කරන, තරුණ පිරිස්වලට ඔවුන් ශිෂ්‍යත්ව ලබා දෙනවා. අවුරුදු කිහිපයක් එම රටේදී අධ්‍යාපනය ලබාදෙනවා. මේ කාලය තුළ දී අර පුද්ගලයන් එතෙක් ආ මාවත වෙනස් කරල අලුත් ගමන් මඟකට යොමුවෙනවා. වසර කිහිපයකට පස්සේ ඔවුන් ආයෙත් තමන්ගේ මව් රටට යනවා. හැබැයි එතකොට ඔවුන් තුළ අර මුලින් තිබුණු ප්‍රගතිශීලීකම් නැහැ. එහිදී ඔවුන් වැඩ කරන්නෙ බටහිර වුවමනාවන්ට අනුව, මෙන්න මේ වගේ සැළසුම්ගත ක්‍රියාවලියක ප්‍රතිඵලයක් විදිහටත්, සමාජවාදයට ආවේණික වුණු දුබලතා නිසාත්, 89 - 91 වන විට ලෝක සමාජවාදී කඳවුර බිඳ වැටෙනවා. 1945 ඉඳල තිබුණු තුලනය බිඳී ගිහින්, ධනවාදී කඳවුර ජය ලබනවා. ඇමරිකාව ප්‍රමුඛ ධනවාදී කඳවුර ලෝකයේ තනි සුපිරි බලවතා බවට පත්වෙනවා. ඒ හරහා ඔවුන් තීරණය කරනවා ලෝකය හොඳින් හෝ නරකින් පාලනය කිරීමට. ඒ සඳහා ඔවුන් විවිධ ක්‍රම භාවිතා කරනව. ආර්ථික බලය, දේශපාලන බලය පමණක් නෙමෙයි. අවශ්‍ය මොහොතක දී යුධ යාන්ත්‍රණය පවා පාවිච්චි කිරීමට ඔවුන් පසුබට වන්නේ නැහැ. ඒ වගේමයි ඔවුන් ලෝකයේ තියෙන විවිධ සංවිධානවලට බලපෑම් කරනව. ඒ හරහාත් බලාපොරොත්තු වන්නේ සෙසු රටවල් පාලනය කිරීම. මෙතනදි ඔවුන් සතු ප්‍රබල මෙවලමක් තමයි රාජ්‍ය නොවන සංවිධාන. ඔවුන් එම රාජ්‍ය නොවන සංවිධානය යොදාගෙන මානව අයිතිවාසිකම් කඩකිරීම, විනිවිද පෙනෙන සුළු ස්වභාවයක් නොමැති වීම වැනි චෝදනා එල්ල කරමින් තමන්ට එකඟ නොවන පාර්ශවයන්ට බලපෑම් කරනව. මෙය ඉතාම බරපතල තත්වයක්. 2000 දී ජෝර්ජ් බුෂ් ඇමෙරිකාවේ ජනාධිපති ධූරයට පත්වීමත් සමඟ මෙම තත්වය වඩාත් උග්‍ර වෙනව. ඔහු දෙවන වතාවටත් ජනාධිපති වුණාට පස්සෙ ඇතිවී තිබෙන තත්වය ගැන අමුතුවෙන් කිව යුතු නෑ.



දැන් ඔවුන් හැකි තරම් උත්සාහ දරන්නෙ ලෝකයම තමන් යටතට ගන්න. ඒ සඳහා ඍජුව කටයුතු කරන තැනකට පත්වෙලා. පෝල් වුල්පොවිට්ස් කියන්නෙ ඇමෙරිකාවේ හිටපු නියෝජ්‍ය ආරක්ෂක ලේකම්වරයා. ඔහු ලෝක බැංකුවේ සභාපති කිරීමට සූදානමක් තියෙනව. ඇමෙරිකාව මේ කෙනෙන් බලාපොරොත්තු වන්නෙ මොකක්ද? තමන්ට ඕන විදිහට ලෝකය පාලනය කිරීම නොවෙයිද?

ඇත්තටම අද ලෝකයේ සිදුවන්නෙ කුමක්ද? සම්පත් හිමි, විශාල ජන සංඛ්‍යාව පාගල සම්පත් තිබුණත් ඒව තමන්ගෙ පරිහරණයට යොදාගන් නැති කුඩා ජන කොට්ඨාශ ලෝකය පාලනය කරනව. අද ලෝකයෙ තෙල් නිෂ්පාදනය ගත්තොත් ඇමෙරිකාව නිෂ්පාදනය කරන්නෙ සුළු ප්‍රමාණයයි. එහෙත් ඔවුන් සතුව විශාල තෙල් සම්පත් ප්‍රමාණයක් තිබෙනව. ඔවුන් ඒව පරිහරණයට යොදා ගන්නෙ නෑ. ඔවුන් කරන්නෙ ලෝකයේ තෙල් නිෂ්පාදනයෙන් තමන්ගෙ අවශ්‍යතාවය සපුරා ගන්නව. ලෝකයේ මුළු තෙල් නිෂ්පාදනයෙන් 25%ක් පරිහරණය කරන්නෙ ඔවුන්. මෙතනින්ම පැහැදිළි වෙනව ඔවුන්ගෙ සැලසුම් මොනවාද කියන එක. කුමක් හෝ සංසිද්ධියක් හරහා ලෝකයේ ආර්ථිකය පාලනය කරන්න තමයි ඔවුන් බලාපොරොත්තු වෙන්නෙ.

ආර්ථිකය පමණක් නෙමෙයි. සෙසු අංශවලිනුත් ඔවුන්ගේ පාලනය ක්‍රියාත්මක කරනව. දේශපාලනය, සංස්කෘතිය මේ හැම පැත්තකින්ම එහෙමයි. මෙය ඉතාම ඛේදජනක තත්වයක්. ලෝකය දුබල කරල ලෝකයේ පාලනය තමන් යටතට ගන්න එක තමයි ඔවුන්ගේ උත්සාහය. මෙම තත්වයන් හමුවේ දකුණු ආසියාවේ රටක් හැටියට ශ්‍රී ලංකාව වගේ රටවල් හරිම අසරණයි.

**සැළසුම්ගත ක්‍රියාවලියක ප්‍රතිඵලයක් විදිහටත්, සමාජවාදයට ආවේණික වුණු දුබලතා නිසාත්, 89 - 91 වන විට ලෝක සමාජවාදී කඳවුර බිඳ වැටෙනවා. 1945 ඉඳල තිබුණු තුලනය බිඳී ගිහින්, ධනවාදී කඳවුර ජය ලබනවා. ඇමරිකාව ප්‍රමුඛ ධනවාදී කඳවුර ලෝකයේ තනි සුපිරි බලවතා බවට පත්වෙනවා. ඒ හරහා ඔවුන් තීරණය කරනවා ලෝකය හොඳින් හෝ නරකින් පාලනය කිරීමට. ඒ සඳහා ඔවුන් විවිධ ක්‍රම භාවිතා කරනව. ආර්ථික බලය, දේශපාලන බලය පමණක් නෙමෙයි. අවශ්‍ය මොහොතක දී යුධ යාන්ත්‍රණය පවා පාවිච්චි කිරීමට ඔවුන් පසුබට වන්නේ නැහැ. ඒ වගේමයි ඔවුන් ලෝකයේ තියෙන විවිධ සංවිධානවලට බලපෑම් කරනව. ඒ හරහාත් බලාපොරොත්තු වන්නේ සෙසු රටවල් පාලනය කිරීම. මෙතනදි ඔවුන් සතු ප්‍රබල මෙවලමක් තමයි රාජ්‍ය නොවන සංවිධාන. ඔවුන් එම රාජ්‍ය නොවන සංවිධානය යොදාගෙන මානව අයිතිවාසිකම් කඩකිරීම, විනිවිද පෙනෙන සුළු ස්වභාවයක් නොමැති වීම වැනි චෝදනා එල්ල කරමින් තමන්ට එකඟ නොවන පාර්ශවයන්ට බලපෑම් කරනව. මෙය ඉතාම බරපතල තත්වයක්.**

ජගත් ජේ එදිරිසිංහ
පළහණ ව ලියූ ජනප්‍රිය නවකතාව
ගිම්හාන සුළඟ
ළබන කලාපයේ සිට කොටස් වශයෙන්